April 2005
Sri Lankan Community Magazine
අප්‍රේල් 2005
ශ්‍රී ලාංකිකයන්ගේ මාසික සඟරාව

# සන්නස

දේශයේ උරුමය වෙනුවෙන්

Issue 1
FREE
පළවන කලාපය
නොමිලේ



# 1505 සිට 2005 දක්වා...

වසර 2500ක ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කිවූ ශ්‍රී ලංකාව මීට අවුරුදු 500කට පෙර එනම් 1505 දී අතිශය අවාසනාවන්ත ඉරණමකට ගොදුරු විය. කතෝලිකයන් හා කුළුබඩු සොයන්නට යයි කියමින් පෙරදිගට පැමිණ තම බලය ව්‍යාප්ත කරමින් සිටි පෘතුගීසීහු එම වසරේදී ශ්‍රී ලංකාවට ද පැමිණියහ. පළමුව උපායශීලීව ශ්‍රී ලංකාව තුළ බින්න බැසගත් ඔවුහු අනතුරුව තුවක්කුවේ හා බයිනෙත්තුවේ බලයෙන් ලංකාවේ මුහුදුබඩ පළාත්වල බලය අල්ලා ගත්හ. මුළු දිවයිනම තමන් යටතට ගැනීමට ඔවුන් මහා සටනක් දියත් කළ ද දේශහිතෛෂී සිංහලයන්ගේ කැප කිරීම් නිසාම ඔවුන්ගේ අරමුණ ව්‍යර්ථ විය.

මීට පෙර ඉතිහාසයේ ද ශ්‍රී ලංකාව විදේශ ආක්‍රමණිකයන්ට යටත්ව තිබුණා නොවේ. සොලීහු, කාලිංගයෝ, චෝලයෝ ආදී ආක්‍රමණිකයෝ පෙර රජ දවස ශ්‍රී ලංකාව ආක්‍රමණය කොට තිබුණහ. මෙරට යටත්කොට ගෙන සිටියහ. එහෙත් ඒ එක් අවස්ථාවක දී වත් මෙරට සමාජයට බටහිරින් පැමිණුනා වූ ව්‍යසනය තරම් දරුණු ව්‍යසනයක් ඇති වූයේ නැත.

මෙම තත්වය අවබෝධකරගත් නිසාදෝ සිංහලයෝ පෘතුගීසීන්ට එරෙහිව නැගී සිටියහ. බැරිම තැන දෙවන රාජසිංහ රජතුමා ලන්දේසීන්ගෙ ද උදව් ඇතිව පෘතු ගීසීන් පලවා හැරියේය. මුලින් හොඳ හිත දිනාගන සිටි ලන්දේසීන් ද සුළු කලකදීම පෘතුගීසීන් සේම ආක්‍රමණකාරී කොල්ලකාරී පිරිසක් බවට පත්වූහ. එනිසාම රජතුමා ඉඟුරු දී මිරිස් ගත්තා යැයි රටවැසියන් තුළ කියමනක් ද ස්ථාපිත විය. අනතුරුව ශ්‍රී ලංකාව යටත් කරගත්තෝ ඉංග්‍රීසීහුය. 1815 දී ඔවුහු මහා හපන්කමක් කළහ. වසර දෙදහස් පන්සීයකට අධික කාලයක් ශ්‍රී ලංකාව තුළ කොහේ හෝ ස්වාධීන රාජ්‍යයක් තිබිණ. එහෙත් 1815 මාර්තු 02 වනදා උඩරට ගිවිසුම අත්සන් කිරීමත් සමග ඒ සියල්ලට නැවතීමේ තිත තැබිණ. එතැන් සිට ශ්‍රී ලංකාව පූර්ණ යටත්විජිතයක් බවට පත්විණ.

ඉංග්‍රීසීහු ශ්‍රී ලංකාව පාලනය කළේ ඔවුන්ගේ හිතුමනාපය පරිදිය. හෙළයේ සාම්ප්‍රදායක ජීවන රටාව අමතක කළ ඔවුහු ශ්‍රී ලංකාව ඔවුන්ගේ ආදායම් මාර්ගයක් කර ගැනීමට පමණක් වෙහෙසුණහ. මේ පීඩාකාරී ක්‍රමයට එරෙහිව දහස් ගණන් සිංහලයෝ නැගී සිටියහ. 1818, 1848 ආදී වර්ෂවල සිදුවූ නැගිටීම් මර්දනය කෙරුණේ සමූල ඝාතනයන් මැදිනි.

1948 දී බ්‍රිතාන්‍යයෝ ශ්‍රී ලංකාවට නිදහස ප්‍රදානය කළහ. එහෙත් ඔවුහු ශ්‍රී ලංකාවෙන් ගියේ ඔවුන්ගේ මුල් ශ්‍රී ලංකාව තුළ ශේෂ කරමිනි. එපමණක් ද ඔවුන් වෙනුවට ශ්‍රී ලංකාව තුළ කළු සුද්දන් කොටසක් ද ස්ථාපිත කරනු ලැබිණ.

එදා සිට අද දක්වාම මෙරට පාලනය කරන්නෝ ඔවුහුය. බටහිර යටත් විජිතවාදයේ උවමනාවට රට පාලනය කරනවා විනා ඔවුන්ට දේශීයත්වය පිළිබඳ හැඟීමක් නැත. මෙරට උරුමය මත පදනම්ව රට යළි නගා සිටුවිය යුතු බවට හැඟීමක් නැත. ඒ අනුව බලන කළ වසර 500කට ඉහත උදාවූ යටත් විජිත යුගයට අප තවමත් සමුදී නැත. අපේ මව් රටේ ඇතැම් පාලකයෝ මෙරටට පෘතුගීසීන් පැමිණීමේ 500වන සැමරුම උත්සවශ්‍රීයෙන් සමරන්නට හැදුවේ ඒ නිසා විය යුතුය. දැන්වත් මෙම තත්වය වෙනස් විය යුතුය. ඒ සඳහා කවුරුන් හෝ පළමු පියවර තැබිය යුතුය. නැතහොත් සිදුවන්නේ ශ්‍රී ලංකාව තවදුරටත් නව යටත් විජිතවාදයේ වළපල්ලට ඇද වැටීමයි.